කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රාසංගික කලා - PART E1015

ප්‍රාසංගික කලා ප්‍රවේශය

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. භරතමුනිගේ "නාට්‍යශාස්ත්‍රය" ආශ්‍රයෙන් ආහාර්යාභිනයට අදාළ විධි නියම පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

02. අපරදිග රටවල ප්‍රාසංගික කලාවන්ගේ විකාසය පිළිබඳ විස්තරයක් කරන්න.

03. ප්‍රාසංගික කලාවක සාර්ථකත්වය උදෙසා රංගාලෝකයේ බලපෑම පිළිබඳ නිදර්ශනාශ්‍රිත සාකච්ඡාවක් කරන්න.

04. ප්‍රාසාංගික කලාවන්ට අදාළව නළුවාගේ (Actor) සහ අභිවාහකයාගේ (Performer) කාර්යභාරයන් පිළිබඳ විමර්ශනාත්මක සාකච්ඡාවක් කරන්න.

05. ප්‍රාසංගික කලාවක මුඛ්‍යාංග පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට, එය සජීවී රංගයක් වීමේ අවශ්‍යතාවයට හේතු පහදන්න.

06. විද්‍යුත් තාක්ෂණයේ වර්ධනය සංගීතය සහ නර්තනය යන කලාවන්ගේ ප්‍රාසංගිකත්වයට කෙසේ බලපෑවේද යි පහදන්න.

07. ප්‍රාසංගික කලාවන්ට අදාළව ප්‍රේක්ෂක තෘප්තිය පිළිබඳව පෙරදිග හා අපරදිග රටවල පවත්නා මතවාද විග්‍රහයට ලක් කරන්න.

08. ගායනය මූලික අධ්‍යාශය කොටගත් සංගීත ප්‍රසංග සඳහා නර්තනය භාවිත කිරීම සම්බන්ධව ඔබේ ආස්ථානය සහේතුකව පැහැදිලි කරන්න.

**************************